# සත් රටක කෙටිකතා

## විදේශීය කෙටිකතා සංග්‍රහය

c) Sumitha Publishers

පරිවර්තනය

**කුසුම් දිසානායක**

සුමිත පොතක්

# **සත් රටක කෙටිකතා**

පරිවර්තනය
කුසුම් දිසානායක

**© කුසුම් දිසානායක**
සියලු හිමිකම් ඇවිරිණි.
ප්‍රථම මුද්‍රණය, 2012

**ISBN - 978-955-696-008-2**

පිට කවරය : මිලාන් සුරංග
කතුවරියගේ ඡායාරූපය : තිලක් හෙට්ටිගේ

(c) Sumitha Publishers

ප්‍රකාශනය

**සුමිත ප්‍රකාශකයෝ**
www.sumithabooks.com
e-mail : info@sumithabooks.com

බෙදාහැරීම:
**සී/ස සරසවි පොත්හල**
30 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්,
506, හයිලෙවල් පාර, නාවින්න - මහරගම.
දුරකථනය : 2804773

# පෙරවදන

නොර්වේ, රුසියාව, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, ඉන්දියාව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල් සතක කෙටිකතා මෙම පරිවර්තන කෘතියට ඇතුළත් වේ. මේ කෙටිකතා සියල්ල මා සිත ඉමහත් කම්පනයට ලක් කළ කෙටිකතා වෙයි. ඒ කම්පනය ම ඒවා පරිවර්තනය කිරීමට මා පොලඹවා ලීය. ඒ කම්පනය ම ඒවා පරිවර්තනය කිරීම දුෂ්කර කළේ සමහර විට පේළි කිහිපයකට වඩා එක්වර පරිවර්තනය කිරීම මට අපහසු වූ හෙයිනි. මා සිත එම පීඩනයෙන් වෙහෙසට පත් වූ නිසා ය. මනුෂ්‍ය දුර්වලතා දෙස, මිනිසුන් මුහුණ දෙන අනෙක විධ දුෂ්කරතා දෙස මේ ලේඛකයන් හෙළන්නේ සානුකම්පික දෘෂ්ටියකි.

හෙමිංග්වේ පැවසුවේ ඔහුගේ කතා ශෛලිය "දිය මත පාවෙන හිම කන්දක් වැනි ය" යැයි කියා ය. අටෙන් හතක් ම දිය යට බවත් මතුපිටින් පෙනෙන්නේ අටෙන් එකක් පමණක් බවත් ඔහු පැවසුවේය. මේ කෙටිකතා තුළින් ද එසේ නෙපෙනෙන දෙයින් ගැඹුරු ජීවිතාවබෝධයක් ලබා ගත හැකි ය. මාරුතයකට හසුවූ ළදල්ලක් ලෙසයින් මිනිස් සිත කම්පනය වී සැලෙන අයුරු අපට පෙනී යයි.

(c) Sumitha Publishers

මගේ සැමියා පේෂී, මගේ පුතු සමිත හා අමාලි, මගේ දුව මධු හා ප්‍රදීප්, මගේ මිනිබිරියන් සුවිනයා, සවෙරා, මිතු සහ සජනි මහත් ආදරයෙන් මෙහි සඳහන් කරනුයේ මා දිරිමත් කරනුයේ ඔවුන් බැවිනි.

පොතේ මුද්‍රණ කටයුතු කළ තරංජී මුද්‍රණාලයේ සියලු දෙනාටත්, පිට කවරය නිර්මාණය කළ මිලාන් සුරංගටත් මගේ ස්තුතිය හිමිවෙයි.

ප්‍රකාශනය සුමිත ප්‍රකාශකයන්ගේ ය. මගේ ආදර ස්තුතිය සුමිත ප්‍රකාශකයන්ටත් හිමිවෙයි.

**කුසුම් දිසානායක**

2 ඒ, පීටර්ස් පෙදෙස, නුගේගොඩ. 2011 අගෝස්තු

# පටුන


01
සහෝදරයෝ - බියොන්ස්ටේර්න් බියොන්සන්
The Brothers - Bjornstern Bjorsen. 10 - 20

02
තාත්තා - බියොන්ස්ටේර්න් බියොන්සන්
The Father - Bjornstern Bjorsen. 21 - 26

03
මිනිස්සු විසිහය දෙනෙක් සහ තරුණියක් - මැක්සිම් ගෝර්කි
Twenty Six Men and A Girl - Maxim Gorky. 28 - 52

04
කළගුණ සැලකීම - ගී ද මෝපසාන්ට්
The Debt - Guy De Moupussant. 54 - 61

(c) Sumitha Publishers

05
දුම්රිය සංඥාකරු තීල් - ගෙයර්හාට් හවුට්මාන්
Flagman Thiel - Gerhart Hauptmann. 63 - 107

06
වෙනත් රටක දී - අර්නස්ට් හෙමිංග්වේ
In Another Country - Earnest Hemmingway. 109 - 117

07
නිධානය - රබීන්ද්‍රනාත් තාගෝර්
The Hidden Treasure - Rabindranath Tagore. 119 - 143

08
තණකොළවල මුදු පහස - ලුයිජි පිරැන්ඩලෝ
The Soft Touch of Grass - Luigi Pirandello. 145 - 152



# බියොන්ස්ටේර්න් බියොන්සන්
## 1832 - 1910

නෝර්වේහි උතුරු කඳුකරයේ උපත ලැබූ බියොන්ස්ටේර්න් බියොන්සන්, නෝර්විජියානු සාහිත්‍යයේ පුරෝගාමියෙකු සේ සැලකේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසු, ඔහු නාට්‍ය රචකයෙකු, විචාරකයෙකු, කවියෙකු, කෙටිකතා හා නවකතා රචකයෙකු මෙන් ම දේශපාලන නායකයෙකු ලෙසින් ද විශිෂ්ට සේවාවක යෙදුණේය. නෙබෙල් ත්‍යාග ඉතිහාසයේ තුන්වැනි ත්‍යාග ලාභියා ඔහු ය. ඒ 1903 වන වර්ෂයේ දී ය. ඔහුගේ අභිලාෂය වූයේ තම රටේ ගොවි ජීවිතය නිරූපණය කිරීමයි. ඔහු අනුගමනය කළ සරල කෙළින් ම සිතේ කතා ශෛලිය ඔහු දැක්වූ සරල ජීවිතවල ස්වභාවය මැනවින් දැක්වීමට සමත් වෙයි. වචන ස්වල්පයකින් ඇඩි භාවමය හැඟීම් ප්‍රකාශ කිරීමට ඔහු සමත් ය.

1910 දී ඔහු මිය ගියේ පැරීසියේ දී ය. ඔහුගේ දේහය රාජ්‍ය ගෞරව සහිතව නෝර්වේ රටට යවන ලදී.

(c) Sumitha Publishers

# සහෝදරයෝ

## බියොන්ස්ටේර්න් බියොන්සන්

The Brothers - Bjornstern Bjorsen.

ගුරුවරයාගේ නම බාර්ඩ් ය. ඔහුට ඇන්ඩර්ස් නමින් සහෝදරයෙක් සිටියේය. ඔවූහු එකිනෙකා ගැන නිතර සැලකිල්ලෙන් සිටියහ. දෙදෙනා ම එකට හමුදා සේවයට බැඳුණාහ. එක ම නගරයේ විසූහ. යුද්ධ කාලය පුරා ම එකට ක්‍රියාන්විත වූහ. එක ම රෙජිමේන්තුවේ සේවය කළහ. දෙදෙනා ම කෝප්‍රල් තනතුර දක්වා උසස් වීම් ලැබූහ. යුද්ධයෙන් පසු ආපසු ගෙදර පැමිණි විට සියල්ලන් ම කීවේ දෙදෙනා ම මනා පෙනුමැති ශක්ති සම්පන්න පුද්ගලයන් බව ය.

ඉන්පසු ඔවුන්ගේ පියා මියගියේය. ඔහු සතු වූ දේපල බෙදා ගැනීම පහසු වූයේ නැත. ඔවුන් දෙදෙනා ම මේ ගැන කතා බහ කර, දේපල ඔවුන් දෙදෙනාගේ සම්බන්ධය අතරට පැමිණීමට ඉඩ නොතැබිය යුතු බව දුටුහ. මේ නිසා සියලු දේපල වෙන්දේසි කළ යුතු බවත්, ලැබෙන ලාබය දෙදෙනා බෙදා ගත යුතු බවටත් ඔවූහු කතිකා කර ගත්හ.

පියා සතු ව රනින් කළ ලොකු අත් ඔරලෝසුවක් තිබිණ. මෙය එම ප්‍රදේශය පුරා ම ප්‍රසිද්ධියට පත් වූවකි. ඒ, එම පෙදෙසේ පුද්ගලයන් දැක තිබූ එක ම රන් ඔරලෝසුව එය වූ හෙයිනි. මෙය වෙන්දේසියට දැමූ විට පොහොසත්තු කිහිප දෙනෙක් ම එය ගැනීමට කැමැත්ත දැක් වූහ. එහෙත් සොහොයුරන් දෙදෙනා එයට ලංසු තැබීමට උත්සුක වූ විට අනික් අය පසු බා සිටියහ. බාර්ඩ් සිතුවේ ඇන්ඩර්ස් එය තමාට ම අයත් වීමට ඉඩ හරිනු ඇත කියා ය. ඇන්ඩර්ස් ද තම සොහොයුරාගෙන් එය ම බලාපොරොත්තු විය. ලංසුව ඩොලර් විස්ස දක්වා ඉහළ ගියේය. එවිට බාර්ඩ් තම සොහොයුරා තමාට කරුණාවක් නොදක්වන්නේ යැයි සිතුවේය. මේ නිසා ඇන්ඩර්ස් සමග තරග කරමින් ඔරලෝසුවේ මිල තිහ දක්වා ඉහළට ගෙන ගියේය. එවේලේත් ඇන්ඩර්ස් පසු බැස්සේ නැත. බාර්ඩ්ගේ සිතිවිලි ඔහුට පැවසුවේ තමා ඔහුට කෙතරම්

(c) Sumitha Publishers

හොඳින් සලකා ඇත්දැයි ඇන්ඩර්ස් අමතක කර ඇති බවයි. ඒ ඇරත් ඔහු වැඩිමලා ය. ඔරලෝසුව තිහටත් ඉහළට ගියේය. ඇන්ඩර්ස් දිගට ම තරගය ගෙන ගියේය. බාර්ඩ් එක විට ම මිල හතළිහ දක්වා ඉහළ දැමුවා පමණක් නොව, තම සොහොයුරා දෙස බැලීම ද නතර කළේය.

වෙන්දේසි කාමරය මීයට පිම්බාක් මෙන් ය. නිශ්චල ය. ඇසුණේ වෙන්දේසිකරු සෙමින් සෙමින් මිල ගණන් නැවත නැවත පවසන හඬ පමණි. බාර්ඩ්ට ඩොලර් හතළිහක් ගෙවීමට හැකි නම් තමාටත් පුළුවන් යැයි නිසල ව සිටගෙන සිටින ඇන්ඩර්ස්ට සිතිණි. ඔරලෝසුව තමාට අයිති වනු දැකීමට බාර්ඩ් අකමැත්තෙන් සිටී නම් එය තමා ම ලබා ගත යුතු ය. එසේ සිතූ ඔහු බාර්ඩ්ට වඩා ඉහළ ලංසුවක් තැබීය. තමාට වූ ලොකු ම නින්දාව මෙය යැයි බාර්ඩ්ට සිතිණ. ඉතා ම සෙමින් ඔහු ඩොලර් පණහකට මිල ඉහළ දැම්මේය. එතැන බොහෝ අය වූහ. මේ සියලුදෙනා ඉදිරියේ තමා සමච්චලයට ලක් කිරීමට තම සොහොයුරාට ඉඩ නොතබන්නේයැයි ඇන්ඩර්ස් තමාට ම කියාගත්තේය. නැවත ලංසුව ඉහළ දැමිණ. බාර්ඩ් හඬ නගා සිනාසුණේය.

(c) Sumitha Publishers

‘ඩොලර් එක සියයයි, මගේ සහෝදරයාමත් එක්ක ම.”

ආපසු යාමට හැරෙන ගමන් ම ඔහු එසේ කීය. ඔහු කාමරයෙන් පිට ව ගියේය.

වෙන්දේසියෙන් ම එවෙලේ මිල දී ගත් අශ්වයාට සැඳැල්ල දමමින් සිටින විට ඔහු වෙත කෙනෙක් පැමිණියේය.

“ඔරලෝසුව තමුසෙගෙ. ඇන්ඩර්ස් තරගෙ අත්හැරියා” යැයි ඔහු කීය.

එය ඇසූ මෙහොතේ ම මහා පසුතැවිල්ලක් ඔහුගේ ඇතුළතින් ම පැන නැඟිණ. දැන් ඔහු සිතුවේ තම සහෝදරයා ගැන ය. ඔරලෝසුව ගැන නොවේ.

සැඳැල්ල දමා අවසාන ය. එහෙත් ඔහු සිටගෙන ම සිටියේය. අශ්වයා මත අත තබාගෙන අශ්වයා මතට නැඟෙම්දැයි නොනැඟෙම්දැයි සිතමින් සිටියේය. බොහෝ දෙනෙක් පිටතට

එමින් සිටියහ. ඔහුගේ සොහොයුරා ද ඒ අතර විය. අශ්වයා සූදානම් කරගෙන පිට ව යාමට සැරසී සිටින තම සොහොයුරා දුටු ඇන්ඩර්ස්, ඒ මොහොතේ බාර්ඩ් සිතමින් සිටියේ කුමක් පිළිබඳ ව දැයි අංශු මාත්‍රයක් වත් නොදැන සිටියේය.

"ඔරලෝසුවට බොහෝම ස්තුතියි බාර්ඩ්." ඔහු හඬ නගා තම සහෝදරයා ඇමතුවේය. "ඔයාගේ සහෝදරයා ඔයාට කරදර කරන දවසක් නම් ආයෙත් කවදාවත් ම නැති වේවි."

"මගේ සෙවනැල්ල වත් ඔයාගේ දොරකඩට වැටෙන දවසක් ආයෙත් කවදා වත් ම නෑ." බාර්ඩ් පිළිතුරු දුන්නේ සුදුමැලි වූ මුහුණින් යුතු ව තම අසුපිටට පැන නැගෙමිනි.

එදිනට පසු තම පියා සමග ජීවත් වූ ගෙදරට දෙදෙනාගෙන් එක්කෙනෙක් වත් අඩියක් නොතැබූහ.

මෙයින් මද කලකට පසු ඇන්ඩර්ස් කුඩා ගොවිපළක් හිමියෙකුගේ දියණියක හා විවාහ විය. තම විවාහ මංගල්‍යයට ඔහු තම සහෝදරයාට ආරාධනා නොකළේය. බාර්ඩ් ද විවාහය පැවැත්වූ පල්ලියට වත් එදින නොගියේය. විවාහ වූ පළමු වසරේ දී ම ඇන්ඩර්ස්ගේ එක ම එළදෙන මිය ගියාය. එක් උදෑසනක, ගෙට උතුරු පැත්තේ ගැට ගසා තිබූ තැන ම එළදෙන මැරී වැටී සිටියාය. මරණයට හේතුව කිසිවකුට වත් දැන ගත නොහැකි විය. වෙනත් අවාසනාවන්ත සිදුවීම් රැසකට ද ඔහුට මුහුණපාන්නට සිදු විය. ඔහුට සිදු වූයේ කබලෙන් ළිපට වැටීමට ය. වඩාත් ම බලවත් ප්‍රහාරය වූයේ ඔහු පිදුරු ගබඩා කළ අටුගේ, එහි අඩංගු සියලු දෙයත් සමග, හේමන්තය මැද එක් රාත්‍රියක දී ගිනි ගැනීම ය. ගින්න හට ගැනුණේ කෙසේ දැයි කිසිවෙක් වත් නොදැන සිටියහ.

"මේක කළේ මට නරකක් ම පතන කෙනෙක් ම යි." කී ඇන්ඩර්ස් රාත්‍රිය පුරා ම හැඬුවේය. ඔහු දුගී බවට පත් විය. වැඩ කිරීමට ඇති උනන්දුව සම්පූර්ණයෙන් ම නැති විය.

(c) Sumitha Publishers

ගින්නට පසු දින සවස බාර්ඩ් තම සහෝදරයාගේ ගෙදරට පැමිණියේය. ඇන්ඩර්ස් ඇඳ මත වැතිර සිටියේය. තම සහෝදරයා දුටු ගමන් ම ඔහු වහා නැඟිට සිටියේය.

“මොනවද මෙහෙ කරන්නෙ.” ඔහු ඇසීය. ඉන් පසු එක පාරට ම නැවතී සිටගෙන තම සහෝදරයා දෙස බලාගෙන ම සිටියේය. පිළිතුරු දීමට පෙර බාර්ඩ් මොහොතක් සිටියේය.

“මට ඔයාට උදව් කරන්ඩ ඕනෑ ඇන්ඩර්ස්. ඔයාට නරක කාලයක් වගෙයි.”

“තමුසෙ හිතුව තරමට වඩා නරකක් මට වෙලා නෑ. යන්ඩ කිව්වෙ මෙතනින්. නැත්තම් මට මාව ම පාලනය කරගන්න බැරිවෙයි.”

“ඔයාට වැරදිලා ඇන්ඩර්ස්. මට කනගාටුයි.”

“යන්ඩ කිව්වෙ බාර්ඩ්. නැතිනම් දෙවියෝ අපි දෙන්නට ම කරුණාව දක්වන සේක්වා!”

(c) Sumitha Publishers

බාර්ඩ් අඩියක් පස්සට තැබුවේය.

“ඔයාට ඔරලෝසුව ඕනෑ නම්” ......... බාර්ඩ්ගේ කට හඬ වෙව්ලීය. ....... “ඒක ඔයාගෙ” ඔහු කීය.

“යන්න බාර්ඩ්” ඔහුගේ සහෝදරයා කෑගැසීය. තව දුරටත් එතැන සිටීමට අකමැති වූ බාර්ඩ් ඉවත් ව ගියේය.

මේ තාක් කල් බාර්ඩ්ට සිදු වූ දෙය මෙයයි.

තම සහෝදරයාට මුහුණ දීමට සිදු වූ අවාසනාවන්ත සිදු වීම් ඇසූ විගස ම බාර්ඩ්ගේ සිත තැවී ගියේය. සිතුවිලි වෙනස් විය. එහෙත් ආඩම්බරය, ක්‍රියා කිරීමෙන් ඔහු වළකාලීය. පල්ලියට යාමට ඔහුට තදබල උවමනාවක් ඇති විය. එහි දී ඔහු නානා විධ යහපත් ක්‍රියා කරන්නේ යැයි තමාට ම දිවුරා ගත්තේය. එහෙත් ඒවා ක්‍රියාවට නැඟීමට ඔහුට ශක්තියක් නොවීය. එහු නිතර ම මෙන් තම සහෝදරයාගේ නිවස පෙනෙන තෙක් මානයට